# ජිනීවා නොගොස් යාපනයට ගියෙමි

4 (අවසාන) කොටස

## කුට්ටම් පොකුණ



ලක්ෂ්මන් කොඩිතුවක්කු

අප ප්‍රභාකරන්ගේ බංකරය දෙසට ගමන් කළේ පාගමනිනි. ඒ අසළට තවමත් වාහනවලට යෑමට ඉඩදෙන්නේ නැත. එම බංකරය පිහිටි කැලෑරොදට යාමට පෙර ඇති ප්‍රධාන අඩිපාරේ ඇති නිවසකි. බොහෝ අවස්ථාවලදී ප්‍රභාකරන් ඇතුළු පවුලේ සැමට කෑම බීම සපයා ඇත්තේ එම නිවසෙනි. එම නිවසේ ජීවත්වන තනිකඩ තරුණියක් හිටපු තම නායකයාගේ බංකරය බලන්නට එන දකුණේ



මිනිසුන් දෙස නොබලයි. මැද මිදුලක් ඇති එම විශාල නිවසේ පැය කිහිපයක් ගත කර යන තම නායකයා පිළිබඳවදෝ සිතමින් ඇය ඈත ආකාශය දිහා බලමින් තම වැඩ කටයුතු කරයි. එම බංකරය අසළ දකුණේ තරුණියන් කිහිප දෙනෙකු රස කැවිලි වෙළඳමෙහි යෙදෙති. වතුර ටැංකියක් අනුරුවට තනා ඇති බංකරය සම්බන්ධ කර ඇත්තේ නිවසකටය. එම නිවස ඉදිරිපස ජනතා ප්‍රදර්ශනයට තබා ඇති ප්‍රභාකරන්ගේ පුතු පාවිච්චි කළ සෙල්ලම් මෝටර් රථය කියාපාන්නේ ප්‍රභාකරන් ගේ දෙබිඩි ජිවිතයයි. එල්ටීටී සංවිධානය වෙනුවෙන් දිවිදුන් ළමා සොල්දදුවන් පිළිබඳ මතකය මගේ සිතට නැවත ඇතුළු වුයේ එම සෙල්ලම් රථය දුටු විටය.

ප්‍රභාකරන් ජිවත්වු බංකර් පිළිබඳව මේ ලිපියෙන් දීර්ඝ ලෙස විවරණය නොකරන්නේ අප රටේ බොහෝ දෙනෙක් ඒ පිළිබඳව බොහෝ කරුණු දන්නා නිසාය. මුලතිව්, කිලිනොච්චි කැලවල පිහිටි බංකර් නරඹා අප ඊළඟට ගමන් කළේ යුද්ධයේ අවසාන දින කිහිපයේ මහ සටන් ඇවිලීගිය මුල්ලිවයික්කාල් ප්‍රදේශයටයි. තවමත් තහනම් කලාපයක් වී ඇති එම ප්‍රදේශය මුහුදට සම්බන්ධ කලපු ප්‍රදේශයකි. පිළිස්සී විනාශ වී ගිය දස දහස් සංඛ්‍යාත වාහනවල නටඹුන් දිහා බලමින් අපි ඉදිරියට ඇදුනෙමු. එම ප්‍රදේශයට යාමට විශේෂ අවසර පත්‍රයක් අවශ්‍ය නිසා එම අවසර පත්‍රය ලබාගැනීමට අපට පැයක පමණ කාලයක් ආරක්ෂක මුරපොලක් අසල ගත කිරීමට සිදුවිය. වලවල් හා මඩවලින් පිරි පාර දිගේ යන විට දකින සමහර වාහන බාගෙට පිළිස්සී පෙරළි ඇත්තේ ජිවත් වී පිළිස්සි ගිය මිනිසුන් සේය. එදා එම ජනයා පාවිච්චි කළ වළං පිඟන් ආදී භාණ්ඩ සමහර තැන්වල තවමත් එලෙසම ඇත. යුද්ධයකදී ඉතිරිවන භාණ්ඩවල සුං බුන්, යුද්ධයේදී මිය ගිය අසරණ මිනිසුන්ගේ ජිවිත ගැන සිහිකරමින් කඳුළු සලන හැටි අපි දුටුවෙමු. එක් තැනක විශාල වළඳක් ලිප්ගල් තුනක් මත ඇත්තේ අළුවී පිළිස්සී ගිය ආහාර වේලද සමඟිනි. තවත් තැනක කුඩා ළමුන් සෙල්ලම් කළ බෝලයක්, පිත්තක් නිසොල්මන්ව බලා සිටින්නේ එම දරුවන් කොහේ ගියාදැයි සිතන්නා සේය. මේ සියලු දේ ගැන මෙනෙහි කරමින් එම පාර දිගේ අප ඉදිරියට ඇදී ගියේ එල් ටී ටී විසින් යුද්ධය පැවති සමයේ මංකොල්ල කෑ පාරා නෞකාව නැරඹීමටය. එම වෙරළ තීරයේම ගාල් කර ඇති එම නෞකාව අද බොහෝ දුරට දිරාපත් වී ඇත.

එම නෞකාව දුටුවිටම මතක්වන්නේ හාල්ය. කොටින් මංකොල්ල කෑ සහල් නැව නිසා එකල උතුරු තීරයේ සහල් මිල සීඝ්‍රයෙන් පහළ ගිය අන්දම ඔබ අප කවුරුත් දන්නා කාරණයකි.

එහෙත් යුද්ධයේ අවසාන කාලයේ කොටින් මෙම නැව පාවිච්චි කර ඇත්තේ සැඟව සිටි නාවික හමුදවට පහරදීමටය. නැව මැදින් කපා කුහරයක් තනා බංකරයක් නිර්මාණය කර ඇති අන්දම දුටුවිට සිහිවන්නේ පැරදුණද ඔවුන් ද යුද්ධයට තීක්ෂණ බවයි. ඒ අසලම තනා ඇති සබ්මැරීන් තටාකය සම්බන්ධ කර ඇත්තේ මහමුහුදටය. බාගෙට තැනු සබ්මැරිනය ඒ අසළම දිරාපත් වෙමින් කියාපාන්නේ එම තාක්ෂණය ඔවුනට ජයග්‍රහණය කිරීමට නොහැකි වු බවකි. ඊළඟට අප නැරඹීමට ගියේ මරාගෙන මැරෙන කොටි කිමිදුම් හටයන් පුහුණු කළ තටාංගනය නැරඹීමටය. මුහුදු කොටි පුහුණු කළ එම තටාංගනය වැනි අංගසම්පුර්ණ පිහිනුම් ජැටියක් අපේ හමුදවටද නැති බව කිවේ අප සමඟ ගිය හමුද නිලධාරියායි. එහෙත් එය අද දිරාපත් වෙන්නට ඉඩහැර ඇත්තේ ඇයිද යන්න පැනයට ඔහුගෙන් පිළිතුරක් ලැබුණේ නැත.

එදා රාත්‍රිය අප ගතකළේ කාන්තා කොටි සෙබලියන් පුහුණු කළ කඳවුරකය. හමුද භාරයේ ඇති එම කඳවුර හමුද නවාතැන් පොලක් ලෙස පරිහරණය කරයි. එදා හිමිදිරියේ අවදි වු අපට මුලින්ම ඇසුණේ ඒ අසල ගම්මානයේ දේව මෙහෙයකි. එම නාගසලන් හඬ අවට සිසාරා පැතිර යන්නේ ස්ත්‍රෝත්‍ර ගායනාද සමඟිනි. එම කෝවිල අසල දැල්වෙන ගිනි දළු අසල නාගසලං රිද්මයට පා ඔසවන වියපත් මිනිසාගේ ජවය දෙස මම බලා සිටියෙමි. "දෙවියන්ට කල හැකි දෑ බොහෝය. දෙවියන් වරෙක මිනිසුන් අඬවයි. වරෙක ඔවුන් නලවයි. එහෙත් එම දෙවියා මිනිසාම නොවේද ? දෙවියන්ට මුහුණු සයක්, අත් දොළහක් දී බලය සියතට ලබාදී ඔහුගෙන් සරණ සොයන මිනිසා සැමදාම අසරණය.

එදා අප ධර්ම පුරම් කඳවුරෙන් පිටත් වුයේ අපට මෙම අවස්ථාවන් නැරඹීමට උදව් කළ අපේ මිතුරු ප්‍රධාන හමුද නිලධාරියාගේ කඳවුර වෙතටය. අද ඔහු එය පාවිච්චි කළද එදා එම කඳවුර අයත්ව තිබුණේ කොටින්ටය. එදා එය කොටින්ගේ චාල්ස් ඇන්තනි බලකායේ ප්‍රධාන කඳවුරකි. චාල්ස් ඇන්තනි ඇති දැඩි කළ එක් බල්ලෙකු තවමත් එහි ජිවත් වේ. එක් බල්ලෙකු සර්පයෙක් දෂ්ඨ කිරීමෙන් මියගිය බව කිව් අපේ මිතුරා ජිවත්වන සුනඛයා අසලට අපව කැඳවාගෙන ගියේය. හාම්පුතා සතුරෙකු ලෙස මියගියද, අද ඌ එහි වෙසෙන සෑම නිලධාරියෙකුගේම මිතුරෙකි. ඌ අප දෙස අතීතය මෙනෙහි කරමින්දෝ බලා සිටියි. "ඕගොල්ලො දන්නවද ඌ අපි දිහා එහෙම බලාගෙන ඉන්නේ ඇයි කියල" මම පිරිසගෙන් ඇසුවෙමි. ඔවුන් නිහඬව සිනහව දල්වාගෙන බලාසිටී.

"උඹලා දෙගොල්ලොම දුන්නු කෑම කාල මං තාම ජිවත් වෙනව. ඒත් උඹල දෙගොල්ලම මැරිල. ජාතිය ජන්මයක් නැතිව ඉපදුනත් මං පින්වන්තයෙක්", බල්ලාට සිතෙන දේ මං දකින අයුරු කී විට ඔවුන් සියල්ලොම සිනසුණහ. ඒත් එසැණින් ආ පණිවිඩයක් අපි තරමක් භීතියට පත්විමු. ඒ අසල කඳවුරක පුනරුත්ථාපනය වන එල්ටීටී සාමාජිකයෙකු හමුද භටයකුගේ තුවක්කුව උදුරාගෙන තමාව පුනරුත්ථාපනය කරන නිලධාරියා ඇතුළු තිදෙනෙකු මරා දමා ඔහුද සියදිවි නසාගෙන ඇති බවකි. එවැනි දෑ බොහෝ වේලාවට මාධ්‍යයට නොඑන ප්‍රවෘත්තිය.

FAMILY GET-TOGETHER & KUAA AGM
Saturday 21st July
From 6.30 PM
www.kuaa.com.au
Kelaniya University graduates, staff and their families are cordially invited to attend. We earnestly request each family to bring along a plate of finger food to be shared with everyone. Tea, coffee and soft drinks will be provided. BYO drinks.
St. Phillip's Anglican Church Hall
80 Catherine Avenue, Mount Waverley
(Cnr of Stephensons Rd & Catherine Av -Melway Ref: 70 D6)
Details: Jayanthi 9807 2034
Fenella 8502 0387
Sarath 9704 5465
Email: secretary@kuaa.com.au
KELANIYA UNIVERSITY ALUMNI ASSOCIATION
AUSTRALIA